# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර් /නොවැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව
**(නව නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ යාතු කර්ම සහ ගැමි නාට්‍ය - DMAT 18224**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

<u>පළමු කොටස</u>

01. අ) අභිචාර (Ritual) යන පදය අර්ථ නිරූපණය කර, අභිචාර පැවැත්වීමේ අරමුණු පැහැදිළි කරන්න. (ලකුණු 05)

ආ) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නාට්‍යමය ලක්ෂණ සහිත ශාන්තිකර්ම තුනක් තෝරාගෙන, ඒවායේ ඇති නාට්‍යමය ගුණය උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 15)

02. රට යකුම ශාන්තිකර්මකරුවා නාට්‍යමය උපක්‍රම යොදා ගනිමින් දැනුම සහ අත්දැකීම් සන්නිවේදනය කිරීමට ගත් උත්සාහය නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 20)

03. අ) උඩරට ශාන්තිකර්ම හාස්‍යය රසය ජනනය කිරීම සඳහා භාෂාව භාවිත කර ඇති ආකාරය උදාහරණ මගින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

ආ) පහතරට ශාන්තිකර්ම හාස්‍යය රසය ජනනය කිරීම සඳහා භාෂාව භාවිත කර ඇති ආකාරය උදාහරණ මගින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

04. "බෞද්ධාගමික කරුණු සමාජගත කිරීම උදෙසා බෞද්ධාගමික වත්පිළිවෙත්වල මනා නාටකීය ගුණයන් අන්තර්ගත කර ඇත." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ මතය හේතු සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 20)

<u>දෙවන කොටස</u>

05. අ) සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ සහ පැවැත්වීමේ අරමුණු සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) "සොකරි නාටකයෙහි පූජාර්ථය මෙන්ම නාට්‍යමය නිරූපණයන්ද අන්තර්ගතය." මෙම ප්‍රකාශය නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 14)

06. අ) කෝලම් නාටකයෙහි උපත් කතාව සැකෙවින් ලියා දක්වන්න. (ලකුණු 06)

ආ) "කෝලම් නාටකය පූජාර්ථය මෙන්ම තත්කාලීන සමාජය වෙත නාටකීයව ප්‍රබල විවේචනයක් එල්ල කරන කලා මාධ්‍යයකි." මෙම අදහස පිළිබඳ ඔබේ මතය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 14)